# මාධ්‍ය නිවේදනය

## කාර්මික නිෂ්පාදන දර්ශකය : 2019 දෙසැම්බර්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011 – 2147401 ෆැක්ස්: 011-2147412 2020 පෙබරවාරි 11**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 දෙසැම්බර් මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් මස නිෂ්පාදනයට සාපේක්ෂව, 2019 දෙසැම්බර් මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි, කාර්මික නිෂ්පාදන දර්ශකයේ 0.4% ක අඩුවීමක් වාර්තා වේ. තව ද 2019 සහ 2018 යන වර්ෂවල දෙසැම්බර් මස මෙම දර්ශකය පිළිවෙලින් 108.6 ක් සහ 109.0 ක් විය.

කාර්මික නිෂ්පාදන දර්ශකය ද ඇතුළත්ව ආර්ථික දර්ශකාංක ගණනාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලැබේ. කාර්මික නිෂ්පාදන දර්ශකය ආර්ථික වර්ධනය මෙහෙයවන ප්‍රධාන අංශ හඳුනා ගැනීමේදී හා ආර්ථික ක්‍රියාකාරිත්වය ඇගයීමේදී වැදගත් වන මිණුමක් වේ. මෙම දර්ශකය නිෂ්පාදන කර්මාන්තයන්හි නිෂ්පාදන ප්‍රමාණය පාදක කර ගනිමින් සකසා ඇත.

2018 දෙසැම්බර් මස මාසික නිෂ්පාදන ධාරිතාවයට සාපේක්ෂව 2019 දෙසැම්බර් මස 'රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය', 'වෙනත් නිෂ්පාදන', (මෝටර් රථ හා ටේලර් නිෂ්පාදන, වෙනත් ගමනාගමන උපකරණ නිෂ්පාදනය, ආභරණ නිෂ්පාදන) සහ 'අඟුරු නිෂ්පාදනය සහ ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව', වල පිළිවෙලින් 25.4%, 7.1% සහ 6.2% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ. තව ද, 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2019 දෙසැම්බර් මාසයේ දී ආහාර නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය ද 2.9% ක වැඩිවීමක් වාර්තා කරයි.

**කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)**

| වර්ෂය / මාසය | දර්ශක අගය |
|---|---|
| 2019 - දෙසැම්බර් | 108.6 |
| 2018 - දෙසැම්බර් | 109.0 |
| | |
| 2018 දෙසැම්බර් මසට සාපේක්ෂව ප්‍රතිශතක වෙනස (%) : -0.4 | |
| | |
| 2019 හතරවන කාර්තුව : 109.8 | |

එසේ වුවත්, 'හම් සහ හම් ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය' , 'මූලික ඖෂධ නිෂ්පාදනය' සහ ' කඩදාසි සහ කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන' වල 2018 වර්ෂයේ දෙසැම්බර් මස නිෂ්පාදනයට සාපේක්ෂව පිළිවෙලින් 20.4%, 17.1% සහ 14.1% ක අඩුවීමක් වාර්තා විය. කාර්තුමය වශයෙන් සැලකූ විට 2018 වර්ෂයේ හතරවනවන කාර්තුවට සාපේක්ෂව 2019 වර්ෂයේ හතරවන කාර්තුව තුළ නිෂ්පාදන කාර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවය 0.7 % කින් වර්ධනය වී ඇත.

2019 දෙසැම්බර් මස කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳව වැඩි විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත. ( www.statistics.gov.lk/Industries)

# Index of Industrial Production (IIP) - 2019

( 2015 = 100)

**108.6**

**December**

IIP is an index which measures short term trends in the volume of Industrial Production

**-0.4%**

Year on Year change

( 2019 Dec - 2018 Dec)

## Significant changes by sector December 2019




## Monthly Change of IIP Since 2017 - January



**Table 01 : IIP of December of 2019 & 2018 and Year on Year changes (2015=100)**

| ISIC 2digit | Description | IIP | | Year on Year (%) Change |
|---|---|---|---|---|
| | | 2018 Dec[R] | 2019 Dec[P] | Dec 2019/Dec 2018 |
| 10 | Food products | 109.7 | 112.8 | 2.9 |
| 11 | Beverages | 100.5 | 105.7 | 5.2 |
| 12 | Tobacco products | 72.1 | 64.5 | -10.4 |
| 13 | Manufacture of Textiles | 90.7 | 82.7 | -8.8 |
| 14 | Manufacture of wearing Apparels | 117.9 | 109.4 | -7.2 |
| 15 | Manufacture of leather and related products | 132.6 | 105.6 | -20.4 |
| 16 | Manufacture of wood and products of wood and cork except furniture; manufacture of articles of Straw and plaiting materials | 100.8 | 97.3 | -3.5 |
| 17 | Manufacture of paper and paper products | 112.1 | 96.3 | -14.1 |
| 18 | Printing and reproduction of recorded media | 108.8 | 102.6 | -5.7 |
| 19 | Manufacture of coke (coal) and refined petroleum products | 106.4 | 113.0 | 6.2 |
| 20 | Manufacture of chemicals & chemical products | 82.0 | 102.8 | 25.4 |
| 21 | Manufacture of basic pharmaceutical products and pharmaceutical preparations | 88.8 | 73.6 | -17.1 |
| 22 | Manufacture of rubber & plastic products | 120.6 | 108.8 | -9.8 |
| 23 | Manufacture of other non-metallic mineral products | 113.6 | 115.1 | 1.3 |
| 24 | Manufacture of basic metals | 124.6 | 131.5 | 5.5 |
| 25 | Manufacture of fabricated metal products ( except machinery equipment ) | 135.5 | 122.1 | -9.9 |
| 26-27 | Manufacture of electrical equipment | 80.3 | 84.5 | 5.2 |
| 28 | Manufacture of Machinery & equipment (n.e.c.) | 97.7 | 91.2 | -6.6 |
| 31 | Manufacture of furniture | 84.2 | 81.8 | -2.9 |
| 29-30-32-33 | Other manufacturing | 66.2 | 70.9 | 7.1 |
| **Overall Index for the Manufacturing Sector** | | **109.0** | **108.6** | **-0.4** |

P-Provisional; R-Revised